# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2380/29 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල.

1A - G 41785 — 19 (2024/04)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කරංගාව ග්‍රාම නිලධාරී වසම නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

*I වැනි තීරුව*

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ W/891 කරංගාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය අයත් වන්නා වූ නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වැනි තීරුවෙහි විස්තර වන ඉම් සලකුණු සහ මායිම් වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

(සටහන: II තීරුවේ දක්වා ඇති ඛණ්ඩාංක මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කඳවල ශ්‍රී ලංකා ඛණ්ඩාංක පද්ධතිය පාදක කර දක්වා ඇත.)

*II වැනි තීරුව*

*උතුර :*

කොන්ඩුවටුවාන වැවේ නැගෙනහිර මායිමෙහි උපරිම ගංවතුර සීමාවෙහි ඉහළ ඊසාන දෙසින් පිහිටි 7.304599, 81.628560 ඛණ්ඩාංකයෙන් ආරම්භක ලක්ෂ්‍යය වී මීටර 400ක් නැගෙනහිර දිශානුගතව පිහිටි ලක්ෂ්‍යය දක්වාත් එතැන් සිට මීටර් 650ක් ඊසාන දිශානුගතව හමුවන ලක්ෂ්‍යය දක්වාත් ගමන් කර එතැන් සිට නැගෙනහිර දිශානුගතව සෘජු රේඛාවක් හරහා අම්පාර, මහඔය නුවර මාර්ගයේ හමුවන 2/3 බෝක්කුවේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වාත්, එතැන් සිට ගිනිකොණ දිශානුගතව කි. මී. 2ක් බුද්ධංගල අභයභූමිය හරහා 7.329234, 81.681209 දරන ඛණ්ඩාංකය දක්වාත් එතැන් සිට දකුණු දෙසට දිශානුගතව කි. මී. 1.3ක් තිස්සපුර ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිමත් බුද්ධංගල ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිමත් හමුවන ලක්ෂ්‍යය 7.318134, 81.685263 දක්වාත් වේ.

*නැගෙනහිර :*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයෙන් ආරම්භ වී මීටර් 500ක් නිරිත දෙසට දිශානුගතව රජවැව වැවෙහි ඊසාන දෙසින් පිහිටි වැව් කණ්ඩියේ ඊසාන දෙසින් පිහිටි මධ්‍ය ලක්ෂ්‍යය දක්වාත් එම මධ්‍ය ලක්ෂ්‍යය ඔස්සේ නිරිත දෙසට දිශානුගතව වැව් කණ්ඩියෙහි නිරිත දෙසින් පිහිටි ආරම්භක ලක්ෂ්‍යය දක්වාත්, එතැන් සිට බටහිර දෙසට දිශානුගතව වැව් රක්ෂිතයේ උපරිම ගංවතුර සීමාව ඔස්සේ 7.310733, 81.675075 ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට බටහිර දෙසට දිශානුගතව බණ්ඩාරනායක මාවතෙහි මධ්‍ය රේඛා ලක්ෂ්‍යය වන 7.310640, 81.674735 ඛණ්ඩාංකය දක්වාත්, එම මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශානුගතව ගමන් කර හමුවන අම්පාර නුවර මාර්ගයෙහි මධ්‍ය රේඛාව තෙක් ද, එම මධ්‍ය රේඛාව ඔස්සේ මීටර් 50ක් දකුණු දිශානුගතව මාර්ගය හරහා ගමන් කරන ඇළ මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට නිරිත දෙසට දිශානුගතව අම්පාර මානසික රෝහල් මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාත් වේ.

*දකුණ :*

එම ලක්ෂ්‍යයේ සිට අම්පාර මානසික රෝහල් මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දිශානුගතව කරංගාව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය වන 7.284427, 81.645511 ඛණ්ඩාංකය තෙක්ද වේ.

*බටහිර :*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කොන්ඩුවටුවාන වැවේ, නැගෙනහිර උපරිම ගංවතුර සීමාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා වූ ප්‍රදේශය වේ.

EOG 04 - 0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.